එච්. එම්. විජිත හේරත්, පා. ම.
எச். எம். விஜித ஹேரத், பா. உ.
H. M. Vijitha Herath, M. P.
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சர்
Minister of Foreign Affairs, Foreign Employment and Tourism


**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගේ වෙසක් දින පණිවිඩය**

අද දින සැමරෙන පූජනීය වෙසක් දිනය වෙනුවෙන්, ශ්‍රී ලංකාවේ සහ ලොව පුරා වෙසෙන බෞද්ධ ප්‍රජාවට, මාගේ උණුසුම් සුබ පැතුම් පිරිනමනවා. වෙසක් දිනය, බුදුන් වහන්සේගේ උපත, බුද්ධත්වය සහ පරිනිර්වාණය යන උත්තරීතර ප්‍රඥාවේ සංධිස්ථාන තුන බැති සිතින් යුතුව සිහිපත් කෙරෙන දිනයක් මෙන්ම මිනිස් මනසෙහි උසස් බව හෙළි කළ සහ දයානුකම්පිත, අර්ථවත් ජීවිතයකට පැහැදිලි මාර්ගයක් පෙන්වා දුන් දිනයක් ලෙස සැලකෙනවා.

යුද්ධ, ගැටුම් සහ දිනෙන් දින තීව්‍ර වන බෙදුම්වාදය හේතුවෙන් අස්ථාවර වී ඇති ලෝකයක, සාමය (ශාන්තිය) පිළිබඳ බුදුන්ගේ ඉගැන්වීම් නිතැනින්ම අදාළ වෙනවා. “අක්කොධෙන ජිනේ කොධං - අසාධුං සාධුනා ජිනේ ” එනම්, "ක්‍රෝධ කරන්නාට ක්‍රෝධ නොකිරීමද, අයහපත් කෙනාට යහපත කිරීමද" කළ යුතු බවට බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබෙනවා. අප, බෙදීම් ඇති කරන බලවේගයන් අභිබවා නැගී සිටිය යුතු අතර, සියලු ජීවීන් කෙරෙහි අසීමිත කරුණාව සහ සැබෑ දයානුකම්පාව පෙරදැරි කරගත් සමගි සම්පන්න ජාතීන් ලෙස ජීවත් විය යුතු වෙනවා. අපගේ රජය විසින් බුදුරජාණන් වහන්සේගේ ධර්මය, ජාතික පුනර්ජීවනයේ හරය ලෙස සලකමින් “ශ්‍රී ලංකාව නැවත ගොඩනැගීමේ” වැඩසටහනට නායකත්වය සපයනවා. එහිදී ආර්ථික ප්‍රකෘතිය කරා යන ගමන සදාචාරාත්මක වගකීමෙන් යුතුව, යහපාලනය සහ සමාජ යහපැවැත්මෙන් යුක්තව, ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කරමින්, සාධාරණ හා තිරසාර සමාජයක් උදෙසා සිදු කරන්නක් වෙනවා.

මේ අසිරිමත් වෙසක් මංගල්‍යය හුදු උත්සවයකට වඩා ඔබ්බට යන ජීවිතාලෝකයක් වේවා යැයි මා ප්‍රර්ථනා කරනවා. මෙත්තා (මෛත්‍රිය), කරුණා (කරුණාව), මුදිතා (අනුවේදනීය ප්‍රීතිය) සහ උපේක්ඛා (සිතෙහි මැදිහත්බව) යන සතර බ්‍රහ්ම විහරණයන්, ජාතීන් අතර සැබෑ සාමය, සහයෝගීතාව සහ අන්‍යෝන්‍ය අවබෝධය ළඟා කර ගැනීමේ මඟ පෙන්වනු ඇතැයි මා විශ්වාස කරනවා. බුදුරජාණන් වහන්සේගේ ධර්මය ආගමික වතාවත් වලට පමණක් සීමා නොවේ. එය දෛනිකව අප රාජ්‍ය පාලනය සිදු කල යුතු ආකාරය, ආරවුල් විසඳිය යුතු ආකාරය සහ එකිනෙකාට සැලකිය යුතු ආකාරය මූර්තිමත් කරන්නක් වේ. බුදුන් වහන්සේ ඉගැන්වූ පරිදි, "අත්තාහි අත්තනෝ නාථෝ" එනම්, "තමාට පිහිට තමාම වේ". අද දිනයේදීත්, එළැඹෙන සෑම අවස්ථාවකදීත්, උතුම් වූ ධර්ම මාර්ගයේ ගමන් කිරීමට අප සියලු දෙනාටම ශක්තිය සහ ධෛර්යය ලැබේවා.

**විජිත හේරත්**
විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍ය
2026 මැයි 30 දින


කාර්යාලය/அலுவலகம்/Office: +94-11-2430221, +94-11-2445498 ෆැක්ස්/பெக்ஸ்/Fax No. : +94-11-2430222
වෙබ් අඩවිය/வலைத்தளம்/Website: www.mfa.gov.lk - ඊමේල්/மின்னஞ்சல்/Email: fmo@mfa.gov.lk
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 01, ශ්‍රී ලංකාව
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு, குடியரசுக் கட்டிடம், கொழும்பு 01, இலங்கை.
Ministry of Foreign Affairs, Foreign Employment and Tourism, Republic Building, Colombo 01.Sri Lanka.